02039



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

| | | |
|---|---|---|
| බෞද්ධ ශිෂ්ටාචාරය I<br>பௌத்த நாகரிகம் I<br>Buddhist Civilization I | 45 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1 සිට 50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරාගෙන එය **පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. බුද්ධකාලීන භාරතයේ ජනප්‍රියව සිටි ශාස්තෘවරුන් අතුරින් 'මරණින් මතු සත්ත්වයාගේ පැවැත්මක් නැතැ'යි ඉගැන්වූයේ,
   (1) පූරණ කස්සප ය.
   (2) පකුධ කච්චායන ය.
   (3) අජිත කේසකම්බල ය.
   (4) මක්ඛලී ගෝසාල ය.
   (5) නිගණ්ඨනාතපුත්ත ය.

2. පහත දැක්වෙන්නේ බුද්ධකාලීන භාරතීය ආගමික විශ්වාස පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.
   A - ඊශ්වර නිර්මාණවාදය ප්‍රාග් බෞද්ධ යුගයේ සිටම දැඩිව මුල් බැසගෙන පැවතුණි.
   B - 'අකිරියං බ්‍යාකාසි' යනුවෙන් අක්‍රියවාදී ඉගැන්වීමක් ඉදිරිපත් කළේ පූරණ කස්සප විසිනි.
   C - ඉන්ද්‍රඛීලයක් සේ ස්ථිර වූ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ සහ ජීව යන සප්ත කායවාදයක් ඉදිරිපත් කරන ලද්දේ පකුධ කච්චායන විසිනි.
   D - චතුයාම සංවරය ජෛන සම්ප්‍රදායට අයත් ඉගැන්වීමකි.
   E - මුසාවාද භය නිසා පිළිතුරු නොදී සිටීම සංශයවාදයේ එක් ලක්ෂණයකි.

   ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,
   (1) A සහ B පමණි.
   (2) A සහ C පමණි.
   (3) A, B සහ C පමණි.
   (4) A, B, C සහ D පමණි.
   (5) A, B, C, D සහ E යන සියල්ල ම ය.

3. බුද්ධකාලීන භාරතයේ වාණිජ්‍යකරණය සහ නාගරීකරණය මුල් කොට ගෙන ඇති වූ සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා බලපාන ලද එක් ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගත හැක්කේ,
   (1) දේව නිර්මාණවාදය පදනම් කරගත් බ්‍රාහ්මණ ඉගැන්වීම මගින් හඳුන්වාදුන් ස්වධර්ම සංකල්පය මැනවින් ක්‍රියාත්මක වීමයි.
   (2) වහල් සේවයට එරෙහිව කුල හීනයන්ගේ නැඟී සිටීමයි.
   (3) ශ්‍රමණ සම්ප්‍රදාය විසින් සාම්ප්‍රදායික බ්‍රාහ්මණ ඉගැන්වීම දැඩි ලෙස විවේචනය කරනු ලැබීමයි.
   (4) නව සිටුවර පන්තියක් බිහි වී වෙළෙඳපොළ පදනම් කරගෙන ආර්ථිකය කළමනාකරණය කිරීමයි.
   (5) මත්ස්‍ය න්‍යාය අනුව බලවත් රාජ්‍ය, අසල්වැසි කුඩා රාජ්‍යයන් යටත් කොට ගෙන පාලන ප්‍රදේශ පුළුල් කර ගැනීමයි.

4. පහත සඳහන් ප්‍රකාශ කියවා නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) දන් දීම බ්‍රාහ්මණ වර්ණයට අයත් ස්වධර්මයක් නොවී ය.
   (2) කාම්බෝජය පිළිබඳ වගකීම පැවරී තිබුණේ ක්ෂත්‍රියයන්ට ය.
   (3) ගෘහස්ථ ආශ්‍රමයේදී ත්‍රිවේද අධ්‍යයනය අනිවාර්ය විය.
   (4) [illegible]
   (5) [illegible]

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers

5. "රාජ භටයන් ඇවිදි මහාකල ප්‍රශ්නය" යන විනය නීතිය බුදුරජාණන් වහන්සේ විසින් පනවන ලද්දේ .................... රජුගේ ඉල්ලීමකට අනුව ය.

(1) සේනිය බිම්බිසාර  (2) පසේනදී කොසොල්  (3) අජාසත්ත
(4) උදේන  (5) චණ්ඩපජ්ජෝත

6. පහත සඳහන් ප්‍රකාශ අවධානයෙන් කියවන්න.

A - බුද්ධකාලීන මගධ රාජ්‍යයේ අගනුවර ආදී පර්වත පහකින් වට වී තිබීම නිසා 'ගිරිබ්බජ' නමින් ප්‍රකට විය.
B - උදේන රජු බුද්ධකාලීන වත්ස රාජ්‍යයේ පාලකයා විය.
C - මහා කච්චාන තෙරුන්ගෙන් බණ අසා චණ්ඩපජ්ජෝත රජු තෙරුවන් සරණ ගියේ ය.
D - වජ්ජි රාජ්‍යයේ ගණතන්ත්‍ර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක විය.
E - බුදුරජාණන් වහන්සේ දහනව වසක් කොසල රාජ්‍යයේ වැඩ විසූහ.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

(1) A සහ B පමණි.  (2) A සහ C පමණි.  (3) A, B සහ C පමණි.
(4) A, B, C සහ D පමණි.  (5) A, B, C, D සහ E යන සියල්ල ම ය.

7. ඇදහිය හැකි තරම් ඇති උපාසිකාවන්ගෙන් අග්‍රස්ථානය ලැබූ .................... සොළොස් වසරක් තිස්සේ ගෘහස්ථ ප්‍රතිපත්තිය ආරක්ෂා කළා ය.

(1) සාමා  (2) උප්පලවණ්ණා  (3) විසාඛාව
(4) බන්ධුල මල්ලිකාව  (5) නකුල මාතාව

8. බුද්ධකාලීන මහ තෙරුන් වහන්සේලා කිහිප නමක් හා සම්බන්ධ ප්‍රකාශ පහක් පහත දැක්වේ.

A - සතර ඉරියව්වෙන් තොරව විරිය වඩා රහත් විය.
B - අවබෝධ ශක්තිය ඇති භික්ෂූන් අතර අග්‍රතනතුර ලැබීය.
C - කෙටියෙන් දෙසූ කරුණු සරල ලෙස විස්තර කිරීමේ හැකියාව පැවතියේ ය.
D - බහුශ්‍රැත භික්ෂූන් අතර අග්‍රතනතුර ලැබීය.
E - පිරිනිවන් පෑමට පෙර තම මෑණියන් සෝවාන් ඵලයෙහි පිහිටුවීය.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් ආනන්ද තෙරුන් වහන්සේගේ චරිතය සම්බන්ධ තොරතුරු පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) A, B සහ C  (2) A, B සහ D  (3) A, B සහ E  (4) B, C සහ D  (5) B, C සහ E

9. "බුදුරජාණන් වහන්සේ අපේ කාලයේ වාසය කළේ වසර ... ගණනාවකට පසුව ය. එයින් ... ඉදිරිපත් ... අද නැගෙන දයාව ... ලෝකය පිරෙයි."

ඉහත ප්‍රකාශය කවරෙකු විසින් සිදු කරන ලද්දක් ද?

(1) මහාචාර්ය ලක්ෂ්මි නරසු
(2) එඩ්වින් ආර්නෝල්ඩ්
(3) මහාචාර්ය මැක්ස් මුලර්
(4) බර්ට්‍රන්ඩ් රසල්
(5) ඇල්බට් අයින්ස්ටයින්

10. සුන් ලොව සතු    ලෙසට
දැනගෙන නොදන්    දනට
දෙසුමෙන් කියමි    මෙසට
....................    ......

කවර පද්‍යයෙන් විස්තර වන බුදුගුණය කුමක් ද?

(1) සුගත  (2) සම්මාසම්බුද්ධ  (3) ලෝකවිදූ
(4) භගවා  (5) විජ්ජාචරණ සම්පන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers

11. සමකාලීන රාජ්‍ය පාලනය පිළිබඳව ඉතා වැදගත් තොරතුරු අඩංගු 'චක්කවත්තිසීහනාද' සූත්‍රයට අනුව සක්විති රජතුමා විසින් තම යටතට පත්වන අනුගාමී රජවරුන් පාලකයන්ට දෙනු ලබන උපදේශය වන්නේ,
(1) පන්සිල්හි පිහිටා ගෙනම රාජ්‍ය පාලනය සිදු කළයුතු බවයි.
(2) දිළිඳුනට ධන දැමීමට ක්‍රියා කළයුතු බවයි.
(3) සිය රාජ්‍යයෙහි අපරාධ මර්දනය පිණිස සැලසුම් කළයුතු බවයි.
(4) චක්‍රවර්ති රාජ්‍යය වනාහි පියාගෙන් පුතුට උරුම වන දායාදයක් නොවන බවයි.
(5) ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහ සමස්ත ජනතාව දැහැමි ආරක්ෂාව සැලසිය යුතු බවයි.

12. "අධනානං ධනං තාත අනුප්පදජ්ජාසි" යනුවෙන් දැක්වෙන්නේ,
(1) ධන සම්පත් කළමනාකරණය පිළිබඳ ඉගැන්වීමකි.
(2) පාලකයා විසින් ජනතාව වෙනුවෙන් ඉටු කළයුතු යුතුකමකි.
(3) ගෘහපතියා විසින් සේවකයා වෙත ඉටු කළයුතු යුතුකමකි.
(4) ජනතාව විසින් රජුට ඉටු කළයුතු යුතුකමකි.
(5) ධනෝපායනය පිළිබඳ ඉගැන්වීමකි.

13. දුර්භික්ෂ ආදී ආපදාසහගත අවස්ථා කරණ කොට ගෙන ජනතාව දුක් පීඩාවලට පත්ව ඇති අවස්ථාවල පාලක පක්ෂය විසින් ජනතාව මත බදු බර නොපැටවිය යුතු බව අවධාරණය කරන ඉගැන්වීම ඇතුළත් වන්නේ,
(1) අග්ගඤ්ඤ සූත්‍රයේ ය.
(2) චක්කවත්තිසීහනාද සූත්‍රයේ ය.
(3) මහා පරිනිබ්බාණ සූත්‍රයේ ය.
(4) අම්බට්ඨ සූත්‍රයේ ය.
(5) කූටදන්ත සූත්‍රයේ ය.

14. දැහැමි පාලකයකු තුළ තිබිය යුතු ගුණධර්ම දහයක් ජාතක පාලියේ දැක්වෙන අතර, ඒවා දසරාජ ධර්ම නමින් හැඳින්වේ. පාලකයා අනිකාගේ නොව අවංකව ක්‍රියා කළයුතු බවත්, මහජනයාගේ දුක් පීඩාවන් පිළිබඳ සංවේදීව කටයුතු කළයුතු බවත් එම දස රාජධර්මවලින් දෙකකි. එම රාජධර්ම දෙක ඇතුළත් වරණය කුමක් ද?
(1) ඉවසීම - මෘදුබව
(2) ක්‍රෝධ නොකිරීම - ඍජුබව
(3) පරිත්‍යාගය - ඍජුබව
(4) ඍජුබව - මෘදුබව
(5) අවිහිංසාව - මෘදුබව

15. ඕනෑම පාලන තන්ත්‍රයක් සාර්ථකව පවත්වාගෙන යාමට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස සමූහයක් වශයෙන් වෝදනා කර ගනිමින් සමගිය සිදු වැරෙන සේ ක්‍රියා කිරීම හඳුන්වා දිය හැකි ය. යහපත් රාජ්‍ය පාලනයේදී සමගිව කටයුතු කිරීමේ වැදගත්කම බෞද්ධ දේශපාලන දර්ශනය තුළ අවධාරණය කොට ඇත. මෙම ඉගැන්වීම ඇතුළත් බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්මය .............................. නමින් හැඳින්වේ.
(1) දස සක්විතිවත්
(2) සතර අගතියෙන් වැළකීම
(3) දස රාජධර්ම
(4) පන්ච සීලය
(5) සප්ත අපරිහානිය ධර්ම

16. නිදහසේ ජීවත්වීමේ අයිතිය, පුද්ගලිකව දේපළ තබා ගැනීමේ අයිතිය හා නිරවුල් පවුල් ජීවිතයක් ගත කිරීමේ අයිතිය සුරක්ෂා කර දීමට දිරිදෙන ඉගැන්වීම ඇතුළත් බෞද්ධ සදාචාර ධර්මය හැඳින්වෙන්නේ,
(1) පන්ච සීලය නමිනි.
(2) නීති ගරුකත්වය නමිනි.
(3) සිව් බඹ විහරණ නමිනි.
(4) සමාජ සහජීවනය නමිනි.
(5) ලෝක පාලක ධර්ම නමිනි.

17. රියසකට කඩ ඇණය මෙන් සමාජයේ යහපැවැත්ම උදෙසා උපයෝගී වන බෞද්ධ සදාචාරමය මූලධර්මයක් ලෙස සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන්නේ,
(1) සතර කර්මක්ලේශ ය.
(2) සතර සංග්‍රහ වස්තූන් ය.
(3) සතර බ්‍රහ්ම විහරණ ය.
(4) සතර අගතියෙන් තොරවීම ය.
(5) සතර සම්මප්පධාන ය.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers

[හතරවැනි පිටුව බලන්න

18. “කැඩපතකින් තමාගේ තම සිරුර නිරීක්ෂණය කරන්නා සේ තම කායික, වාචසික, මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කළ යුතු ය.” අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ ඉගැන්වෙන මෙම ධර්මෝපදේශයෙන් ............ සඳහා වැරදි ක්‍රියාවන්ගෙන් අත්මිදීමට උපදෙස් ලැබේ.
(1) තමාට සිදුවන හානිය
(2) අනුන්ට සිදුවන හානිය
(3) තමා හා අනුන් යන උභය පක්ෂයට සිදුවන හානිය
(4) මෙලොව පරලොව නැවීමට සිදුවන බව
(5) ලෝභ, ද්වේෂ, මෝහ වැඩිවන බව

19. සිගාලෝවාද සූත්‍රයේ 'ඡ අපාය මුඛ' හෙවත් භෝග විනාශ වීමේ දොරටු හයට අයත් **නොවන්නේ,**
(1) ස්ත්‍රීන්ට ලොල්වීමයි.
(2) සුරාවට ලොල්වීමයි.
(3) සූදුවට ලොල්වීමයි.
(4) පාපමිත්‍ර සේවනයයි.
(5) අලසභාවයයි.

20. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන පරිදි සම්පත් පරිභෝජනයෙහිලා අජද්ධුමාරික හෙවත් බොහෝ සම්පත් තිබියදීත් නොකා නොබී මිය යන හීන පරිභෝජනයත්, උදුම්බරඛාදික හෙවත් දිඹුල් ඵල කන්නා සේ සිදු කරනු ලබන විනාශකාරී අධිපරිභෝජනයත් බුදුදහම බැහැර කරයි. එහිලා සම්පත් පරිභෝජනය හා කළමනාකරණය පිළිබඳ බුදු දහමේ නිර්දේශය ලෙස හඳුනාගත හැක්කේ,
(1) මධ්‍යම ප්‍රතිපදාවයි.
(2) සම්මා ආජීවයයි.
(3) පඤ්ච බලි සංකල්පයයි.
(4) සමජීවිකතාවයි.
(5) භෝග සුඛයයි.

21. “සිත්කලු වූ වෘක්ෂයෝ පිපුණු මල් ඇත්තාහු නානාවිධ සියලු දිශාවන්හි සුවඳ හමින් පත්‍ර හෙළා හැර ඵල ගැනීමට ලං වූවාහු ය. වීරයන් වහන්ස, මෙයින් නික්ම යාමට කල්වෙයි.”
ථෙර ගාථා පාලියේ එන මෙම ප්‍රාකෘතික වර්ණනාව සිදු කරන ලද්දේ,
(1) සංකිච්ච හිමියන් විසිනි.
(2) වංගීස හිමියන් විසිනි.
(3) සප්පක හිමියන් විසිනි.
(4) වනවච්ඡ හිමියන් විසිනි.
(5) කාළුදායි හිමියන් විසිනි.

22. මල්පල උයන් වවන්නෝ වෙත් ද
වන වගා කොට දෙන්නෝ වෙත් ද
ඒ දඬු පාලම් කරවන්නෝ වෙත් ද
පැන් හල්, පැන් පොකුණු ආවාස ඉදි කොට දෙත් ද
මේ ආදී පරිසර සංරක්ෂණ කටයුතු සිදු කරන අයට ලැබෙන ආනිසංස ලෙස සංයුත්ත නිකාය වනරෝප සූත්‍රයේ දක්වා ඇත්තේ,
(1) දෙලොව සතුටුවන බවයි.
(2) නිවනින් සැනසීම උදාවන බවයි.
(3) දිවා රෑ පින් වැඩෙන බවයි.
(4) පරලොව සුගතියෙහි උපදින බවයි.
(5) සිහි මුළාවීමකින් තොරව කළුරිය කරන බවයි.

23. ධන සම්පත් කළමනාකරණය පිළිබඳ සිගාලෝවාද සූත්‍රගත උපදේශය මගින් බුදුදහම නිර්දේශ කොට ඇත්තේ උපයන ලද සම්පත් කොටස් හතරකට බෙදා පරිහරණය කළ යුතු බව ය. ඒ අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) දෙකොටසක් පරිභෝජනයටත්, ආයෝජනයට හා සංරක්ෂණයට එක් කොටස බැගිනුත් යෙදවිය යුතු බවයි.
(2) දෙකොටසක් සංරක්ෂණයටත්, පරිභෝජනයට හා ආයෝජනයට එක් කොටස බැගිනුත් යෙදවිය යුතු බවයි.
(3) දෙකොටසක් ආයෝජනයට වෙන් කොට, අය-වැය සමව පවත්වා ගෙන යා යුතු බවයි.
(4) ආයෝජනයට සහ සංරක්ෂණයට මෙන්ම මහණ බමුණන්ට දන්දීම ආදී පරලොව හිත පිණිස ද කොටසක් වෙන් කළ යුතු බවයි.
(5)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers

24. 'සච්චවිත අලිකවාදිනා' යන ධම්මපද ගාථා පාඨයේ අර්ථය වනුයේ,
(1) බොරු කියන්නා සත්‍යයෙන් දිනිය යුතු ය. යන්නයි.
(2) බොරු කියන්නා විශ්වාස කළ නොහැකි ය. යන්නයි.
(3) සත්‍යය කවදා හෝ ජය ගනියි. යන්නයි.
(4) සත්‍යයෙන් මිස අසත්‍යයෙන් කිසිවක් දිනිය නොහැකි ය. යන්නයි.
(5) සත්‍යයෙන් සුගතියට ද බොරුවෙන් දුගතියට ද පමුණුවයි. යන්නයි.

25. මංගල සූත්‍රයෙහි සඳහන් වන 'බාහුසච්ච' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) පැවිද්දන් සහායෙන් වීම
(2) චතුරාර්ය සත්‍යය දැකීම
(3) බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව
(4) ශිල්පයෙහි දක්ෂ බව
(5) යහපත් පැවතුම් ඇති බව

26. 'ධම්මකාමෝ භවං හොති' යනු 'ධර්මය කැමති තැනැත්තා දියුණු වේ' යන අර්ථයයි. මෙම පාඨය ඇතුළත් වන සූත්‍රය කුමක් ද?
(1) මහාමංගල (2) සිඟාලෝවාද (3) ව්‍යග්ඝපජ්ජ (4) පරාභව (5) වසල

27. බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන්ගේ දක්ෂතා හඳුනාගෙන ඒවා ඇගයීමට උත් කළහ. අග්‍ර තනතුරු ප්‍රදානය මීට උදාහරණයක් ලෙස දැක්විය හැකි ය. ඒ අනුව ඒ ඒ ක්ෂේත්‍රවල සුවිශේෂ හැකියාවන් ඇති ශ්‍රාවක ශ්‍රාවිකාවන් වෙත අග්‍ර තනතුරු ප්‍රදානය කිරීමෙන් ප්‍රදර්ශනය වන්නේ බුදුරජාණන් වහන්සේගේ,
(1) නම්‍යශීලී ගුණයයි.
(2) මහාකරුණාවයි.
(3) විශිෂ්ට ශාස්තෘත්වයයි.
(4) අනභිමානී බවයි.
(5) යථාවාදී තථාකාරී බවයි.

28. ධුතාංගධාරීන් අතර අග්‍ර වූයේ ............................ මහරහතන් වහන්සේ ය.
(1) මහාකාශ්‍යප
(2) අනුරුද්ධ
(3) කොණ්ඩඤ්ඤ
(4) උපාලි
(5) මහාකච්චාන

29. ශ්‍රෝණාපරාන්ත ප්‍රදේශයට වැඩම කොට දැහි වර්ගයා ඇතුළු ප්‍රදේශවාසීන් සසුන්ගත කිරීමට කටයුතු කළේ,
(1) සැරියුත් හිමියන් ය.
(2) මුගලන් හිමියන් ය.
(3) පුණ්ණමන්තානිපුත්ත හිමියන් ය.
(4) මහාකාශ්‍යප හිමියන් ය.
(5) කොණ්ඩඤ්ඤ හිමියන් ය.

30. ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස **නොසැලකිය** හැකි කරුණ කුමක් ද?
(1) බුද්ධානුබුද්ධ ශික්ෂා පද වෙනස් නොකිරීමට තීරණය කිරීම
(2) ධර්ම විනය ශාස්තෘත්වයෙහිලා සැලකීමට තීරණය කිරීම
(3) බුදුරදුන් විසින් දේශනා කරන ලද ධර්මය නිකාය පහක් යටතේ සංග්‍රහ කිරීම
(4) භික්ෂු-භික්ෂුණී විනය, ග්‍රන්ථ පහක් යටතේ සංග්‍රහ කිරීම
(5) ධර්ම විනය සුරක්ෂිත කිරීමේ වගකීම භාණකානුශිෂ්‍ය පරම්පරා වෙත පැවරීම

31. වජ්ජිපුත්තක භික්ෂූන් විසින් යස හිමියන්ට පටිසාරණිය හා උක්ඛෙපනීය කර්ම සිදුකොට දඬුවම් පනවන ලද්දේ,
(1) දස වස්තුව විනය විරෝධී බව පැවසීම හේතුවෙනි.
(2) කාලාශෝක රජුට වජ්ජිපුත්තක භික්ෂූන්ගේ විනය විරෝධී ක්‍රියා දැනුම් දීම හේතුවෙනි.
(3) භික්ෂූන්ට මුදල් නොදෙන ලෙස විශාලා මහනුවර වැසියන් දැනුවත් කිරීම හේතුවෙනි.
(4) මුදල් සම්මාදම් කිරීමට විරුද්ධ වීම හේතුවෙනි.
(5) වජ්ජිපුත්තක භික්ෂූන්ට එරෙහිව සංඝයාට චෝදනා ඉදිරිපත් කිරීම හේතුවෙනි.

Download all Past Papers>  https://bookbeekid.com/resource/past-papers

32. අශෝක රජතුමා විසින් සංඝයා නිර්මල කිරීමේ කටයුත්තක් සඳහා ඇමතිවරයෙකු පත් කොට භික්ෂූන් අතරට පිටත්කර හරින ලද බවත්, එම ඇමතිවරයා විසින් තම උත්සාහය අසාර්ථක වීම නිසා භික්ෂූන් ඝාතනය කළ බවත් පෙළිපොත් වංශකථා සඳහන් වේ. අශෝක රජතුමා විසින් මෙම ඇමතිවරයා පත් කරන ලද්දේ,
(1) භික්ෂූන් විනය කර්ම නොකිරීමට හේතු සොයා බැලීමටයි.
(2) විනය සම්බන්ධයෙන් භික්ෂූන් අතර පැවති වාද-විවාද සමථයට පත් කිරීමටයි.
(3) භික්ෂූන්ගේ විනය විරෝධී කටයුතු පාලනය කිරීමටයි.
(4) භික්ෂූන් ධර්ම විනය වැරදි ලෙස අර්ථකථනය කිරීමට හේතු සොයා බැලීමටයි.
(5) ධර්මකාමී භික්ෂූන්ගේ කටයුතුවලට බාධා කළ අවිනයවාදීන් මැඩ පැවැත්වීමටයි.

33. මිනිස් ඝාතන හේතුවෙන් කම්පාවට පත් වූ අශෝක රජු දිග්විජය ප්‍රතිපත්තිය හැර දමා ධර්මවිජය ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට පෙළඹුණු බව සඳහන් වන ගිරි ලිපිය කුමක් ද?
(1) මස්කි (2) ගිර්නාර් (3) කාල්සි (4) භාබ්‍රු (5) මාන්සේරා

34. කනිෂ්ක රජතුමා විසින් බුදුසමයේ චිරස්ථිතිය පිණිස සිදු කරන ලද සේවාවන් කිහිපයක් පහත සඳහන් ප්‍රකාශවල අන්තර්ගත වේ.
A - සිවුවන ධර්ම සංගායනාවට අනුග්‍රහ දැක්වීම
B - දුසිල් භික්ෂූන් සසුනෙන් නෙරපා ශාසන ශෝධනයක් සිදු කිරීමට පියවර ගැනීම
C - ධර්මය තඹපත්වල ලියා ශෛලමය මංජුසාවක බහා එය නිදන්කොට විහාරයක් ඉදි කිරීම
D - කාසිවලට බුදුරුව ඇතුළත් කිරීම
E - ධර්ම මහාමාත්‍යවරුන් පත්කොට භාරතය තුළ හා භාරතයෙන් පිටත ධර්ම ප්‍රචාරයට කටයුතු කිරීම
නිවැරදි ප්‍රකාශ තුන ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B සහ C (2) A, C සහ D (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

35. පුරාණ භාරතීය අධ්‍යාපන ආයතන තුළ ක්‍රියාත්මක වූ ඉගැන්වීම් ක්‍රම ශිල්ප පහත් පහත දැක්වේ.
A - විවාද ක්‍රමය
B - සාකච්ඡා ක්‍රමය
C - පැවරුම් ක්‍රමය
D - දේශනා ක්‍රමය
E - සම්මන්ත්‍රණ ක්‍රමය
මෙම ඉගැන්වීම් ක්‍රම ශිල්ප අතුරින් නාලන්දා විශ්වවිද්‍යාලයේ භාවිත වූ ඉගැන්වීම් ක්‍රම ශිල්ප ඇතුළත් වරණය තෝරන්න.
(1) A, B සහ C (2) A, B සහ D (3) A, C සහ E (4) B, C සහ D (5) B, C සහ E

36. ප්‍රාග් බෞද්ධ ලක්දිව පැවති ආගමික ඇදහිලි හා විශ්වාසවලට ගරු කළ පණ්ඩුකාභය රජතුමා සිය ගෙ උයන තුළම දෙවොලක් ඉදිකර දුන්නේ,
(1) කාලවේල යක්ෂයාට ය.
(2) චිත්තරාජ යක්ෂයාට ය.
(3) වළවාමුඛී යක්ෂණියට ය.
(4) පශ්චිම රාජිනී යක්ෂණියට ය.
(5) මහේජ යක්ෂයාට ය.

37. අනුරාධපුර යුගයේ මහාවිහාරයේ හා අභයගිරියේ වැඩ සිටි භික්ෂූන්ගේ ශාසනික සේවා කිහිපයක් පහත දැක්වේ.
A - ස්වාභාවික විපත් සමයන්හිදී පවා දිවි පරදුවට තබා බුද්ධධර්මය ආරක්ෂා කිරීම.
B - ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙහිලා පුරෝගාමී වීම
C - නව ශාසනික ප්‍රවණතා පිළිබඳ අවදියෙන් සිට ප්‍රගතිශීලීව කටයුතු කිරීම
D - අපූර්ව ග්‍රන්ථ සම්පාදනයෙහිලා පුරෝගාමී මෙහෙවරක් ඉටු කිරීම
E - නව ආගමික සංකල්ප හඳුන්වා දෙමින් ආගමික භක්තිය වැඩි දියුණු කිරීමට පුරෝගාමීව කටයුතු කිරීම
ඉහත ශාසනික සේවා අතුරින් අභයගිරි සම්ප්‍රදායට වඩාත් අදාළ වන ශාසනික සේවා දෙක ඇතුළත් වරණය කුමක් ද?
(1) A සහ B (2) B සහ [illegible] (3) [illegible] (4) C සහ E (5) D සහ E

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers

**38.** පැරණි ලක්දිව රාජ්‍ය පාලනය හා බුද්ධාගම සම්බන්ධව පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) ආන්තරික ප්‍රශ්නවලින් පසුව පැරණි පුරෝහිත තනතුරේ වගකීම් බෞද්ධ භික්ෂූන්ට හිමි විය.
(2) ඇතැම් අදූරදර්ශී රජවරුන්ගේ ශාසනික ක්‍රියාවන් හේතුකොට ගෙන ශ්‍රී ලාංකේය සංඝ සමාජය තුළ භේදීම ඇති විය.
(3) වලගම්බා රජු හා මහාවිහාරයේ භෙවෙණියන් අතර ඇති වූ ගැටුම් කුපික්කල මහාතිස්ස හිමියන්ගේ මැදිහත් වීමෙන් සමථයකට පත් විය.
(4) භික්ෂූන්ගේ මැදිහත් වීමෙන් රජකම හිමි ලජ්ජිතිස්සට එය අහිමි කොට ථුල්ලත්ථන අභිෂේක කරවිය.
(5) දුටුගැමුණු රජු අන් නිකාය සමගි කොට ශාසන ශෝධනයක් සිදු කළේ ය.

**39.** මහාසෙන් රජතුමා විසින් ඉදිකරන ලද ජේතවන සම්ප්‍රදායට අයත් වූ ප්‍රකට විහාරය හැඳින්වෙන්නේ,

(1) ඉසුරුමුණි විහාරය නමිනි. (2) දක්ඛිණගිරි විහාරය නමිනි. (3) ප්‍රාචීනාරාමය නමිනි.
(4) ලංකාරාමය නමිනි. (5) වෙස්සගිරි විහාරය නමිනි.

**40.** ක්ෂත්‍රියයෙකු රජ වන්නේ බුදුරජාණන් වහන්සේගේ පාත්‍රය හා සිවුර රකින්නට බව සඳහන් කරමින් ක්‍රි.ව. 10 වන සියවසේදී ශිලා ලේඛනයක් පිහිටුවන ලද්දේ ............................ රජු විසිනි.

(1) IVවන මිහිඳු (2) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල
(3) කීර්ති ශ්‍රී මේඝවර්ණාභය (4) IVවන අග්බෝ
(5) දුටුගැමුණු

**41.** බුදුරජාණන් වහන්සේ ජීවමාන සමය තුළදීම බුරුමයට බුදුදහම සම්ප්‍රාප්ත වූ බවට එරටෙහි ප්‍රකට ජනප්‍රවාද කිහිපයක් පවතී. එවැනි ජනප්‍රවාදයක් ලෙස **නොගැළපෙන** ප්‍රකාශය වන්නේ,

(1) බුරුම ජනතාව බුදුරදුන් වෙනුවෙන් සඳුන් දැවයෙන් ආරාමයක් ඉදි කළ බවයි.
(2) තපස්සු භල්ලුක වෙළෙඳුන් බුදුරදුන්ගේ කේශ ධාතු තැන්පත් කොට ස්තූපයක් ඉදි කළ බවයි.
(3) බුරුමයේ ඇතැම් රාජවංශ ශාක්‍ය වංශිකයන්ගෙන් පැවත එන බවයි.
(4) සෝණ හා උත්තර යන භික්ෂූන්ගේ ආරාධනාවක් අනුව බුදුරදුන් බුරුමයට වැඩම කළ බවයි.
(5) ධඤ්ඤවතී නුවර චන්ද්‍රසූර්ය රජුගේ ආරාධනාවකට අනුව බුදුරදුන් බුරුමයට වැඩම කළ බවයි.

**42.** බුරුම බුදුසමයේ සමෘද්ධිය පිණිස බලපාන ලද ප්‍රධාන සාධකයක් වූයේ ත්‍රිපිටකය බුරුම බසට පරිවර්තනය වීමයි. එසේ බුරුම බසට පරිවර්තනය කිරීම සඳහා අනුග්‍රහය සපයන ලද රජතුමා වන්නේ,

(1) ක්‍යාන්සිත්ථ ය. (2) නරපතිසිථු ය. (3) මිංදොන් මින් ය.
(4) ධම්මචේතිය ය. (5) අනුරුද්ධ ය.

**43.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් තායිලන්තයේ තාවකාලික පැවිද්ද හා සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) පැවිදිවීම උත්සවශ්‍රීයෙන් සිදු කරනු ලබයි.
(2) උපැවිදිවීම ද උත්සවශ්‍රීයෙන් සිදු කරනු ලබයි.
(3) විසි වයස් සපිරූ තරුණයන් කෙටි කාලයකට හෝ පැවිදිවීම චිරාගත සම්ප්‍රදායකි.
(4) තාවකාලික පැවිද්ද විවාහයට විශේෂ සුදුසුකමකි.
(5) තාවකාලික පැවිද්ද රැකියා ලැබීමට විශේෂ සුදුසුකමකි.

**44.** ශ්‍රී ලංකාවෙන් චීනයට වැඩම කළ දේවසාරා භික්ෂුණිය ඇතුළු භික්ෂුණීන් කණ්ඩායම විසින් ක්‍රි.ව. 433 දී පමණ චීනයේ භික්ෂුණී ශාසනය ප්‍රතිෂ්ඨාපනය කළ බව ඓතිහාසික වාර්තාවලින් පැහැදිලි වේ. මෙම භාරදූර කටයුත්ත වෙනුවෙන් සහයෝගය ලබා දුන් භික්ෂූන් වහන්සේ වූයේ,

(1) සංඝවර්මන් ය. (2) බෝධිධර්ම ය. (3) කුමාරජීව ය.
(4) බුසාලන් ය. (5) ෆාහියන් ය.

**45.** සෙන් බුදුසමයේ ආභාසයෙන් ජපන් සංස්කෘතියේ සෑම ක්ෂේත්‍රයකම ප්‍රබල පරිවර්තනයක් සිදු වූ බව පිළිගැනේ. එරට සාම්ප්‍රදායික සටන් කලාව තුළ ද මෙම පරිවර්තනය දැක ගත හැකි වේ. ජපානයේ එම සටන් කලාව ............................ නමින් හැඳින්වේ.

(1) [illegible] (2) [illegible] (3) [illegible] (4) [illegible] (5) [illegible]

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers

46. මහායාන බුදුදහම පැතිරී ගිය රටවල බහුලව දක්නට ලැබෙන බුද්ධ ප්‍රතිමා කලාව තුළ භාවිත සුවිශේෂ ආසන ක්‍රමයක් වූ වජ්‍රාසනයෙන් නිරූපණය වන්නේ,

(1) සමාධියයි. (2) උපේක්ෂාවයි. (3) මෛත්‍රියයි.
(4) මහාකරුණාවයි. (5) වීර්යයයි.

47. භාරතීය ස්තූප කලාවේ සමාරම්භය පිළිබඳ විද්වතුන් අතර විවිධ මත දක්නට ලැබෙන අතර ස්තූප ශ්මශානයන්ගෙන් ප්‍රභවය වූ බව ප්‍රකාශ කරන ලද්දේ .................................. විසිනි.

(1) ඒ.එම්. හෝකාට් (2) වී.එස්. අග්‍රවාල් (3) ජෝන් මාෂල්
(4) රෝලන්ඩ් සිල්වා (5) පර්ගිසන්

48. සඳකඩපහණේ එක් පෙළට ගමන් කරන සතුන් හතර දෙනාගෙන් සතර දිශාව සංකේතවත් වන බව ප්‍රකාශ කරන ලද්දේ,

(1) එච්.සී.පී. බෙල් විසිනි. (2) ඩී.ටී. දේවේන්ද්‍ර විසිනි.
(3) විනී විතාරණ විසිනි. (4) විලියම් ජී. වෝඩ් විසිනි.
(5) වින්සන්ට් ස්මිත් විසිනි.

49. අනුරාධපුරයේ දක්නට ලැබෙන බොහෝ .................................. ශීර්ෂය සතර මුඛයකින් නිකුත් වන ලියවැලක විලාසය ගත් අතර එම ලියවැල කෙළවර වන්නේ විශාල චක්‍රාකාර දඟරයක් හෙවත් සංඛ සුවිලතාකරණයකින් ය.

(1) මුරගල්වල (2) වාහල්කඩවල (3) පියගැටපෙළවල
(4) කොරවක්ගල්වල (5) සඳකඩපහණ්වල

50. ජාතක කථා, බුද්ධ චරිතය, ශ්‍රී ලාංකේය ශාසන ඉතිහාසය මෙන්ම ත්‍රිවිධ චෛත්‍යය හා බැඳුණු පූජනීය වස්තූන් මුල්කර ගනිමින් සම්භාව්‍ය සිංහල සාහිත්‍ය කෘති සමුදායක් බිහි වී තිබේ. හෙළයේ මහා කාව්‍යය ලෙස සම්භාවිතාවට ලක්ව ඇති 'කව්සිළුමිණ' ද එබඳු සාහිත්‍ය කෘතියකි. එම සාහිත්‍ය කෘතිය සඳහා තේමා වී ඇත්තේ,

(1) බුද්ධ චරිතයයි. (2) ත්‍රිවිධ රත්නයයි. (3) ගුත්තිල ජාතකයයි.
(4) සත්තුභත්ත ජාතකයයි. (5) කුස ජාතකයයි.

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

**45 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

1. (i) ක්ෂත්‍රිය වර්ණයට අයත් ස්වධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල එන යාග ක්‍රම **තුනක්** කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03යි.)
   (iii) බ්‍රාහ්මණ සම්ප්‍රදාය තුළ භාරතීය කාන්තාවගේ නිදහස සීමා කර තිබූ බවට සාධක **හතරක්** සැකෙවින් දක්වන්න. (ලකුණු 04යි.)
   (iv) මක්ඛලී ගෝසාලගේ ආගමික ඉගැන්වීම් විධිමත්ව පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)
   (v) මක්ඛලී ගෝසාලගේ ඉගැන්වීම් බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් විචාරයට ලක් කරන්න. (ලකුණු 06යි.)

2. (i) 'විජ්ජාචරණ සම්පන්න' බුදු ගුණයට අයත් චරණ ධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03යි.)
   (iii) බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව සාධක **හතරක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 04යි.)
   (iv) ආදර්ශවත් බෞද්ධ උපාසකයකු වූ චිත්ත ගෘහපතිතුමාගේ චරිතය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 05යි.)
   (v) යහපත් පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීමෙහිලා සප්ත අපරිහානීය ධර්මවලින් ලැබිය හැකි පිටිවහල කොතෙක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

3. (i) "තණ්හාය ජායතී සෝකෝ" යන ධම්ම පද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)
   (ii) ඉහත 3 (i) හි සඳහන් ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) සිගාලෝවාද සූත්‍රයේ එන ස්වාමි-භාර්යා යුතුකම් හා වගකීම් **දහය** නම් කරන්න. (ලකුණු 04යි.)
   (iv) ගිහි ජීවිතය සාර්ථක කර ගැනීමට අදාළ මංගල කරුණු **පහක්** විස්තර කරන්න. (ලකුණු 05යි.)
   (v) අසීමිත ආශාව වෙනුවට අල්පේච්ඡ ජීවිතයක කාලීන වැදගත්කම බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් විවරණය කරන්න. (ලකුණු 06යි.)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## II කොටස

4. (i) ගුණගරුක සමාජයක් ගොඩනැගීමෙහිලා දස පින්කිරියවත් අදාළ කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) ඉද්ධියේ ප්‍රභේද පැහැදිලි කොට බෞද්ධ ප්‍රතිපදාව පිරීමට ඉද්ධිය පදනම් වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 10යි.)

5. (i) ලෞකික ජීවිතයේ පරමාර්ථය ආර්ථික සමෘද්ධිය පමණක් නොවන බව චතුර්විධ සැපය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පහදා දෙන්න. (ලකුණු 10යි.)

(ii) ස්වච්ඡන්දතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගලයා තුළ ආත්ම විශ්වාසය ගොඩනැංවීම පිණිස ඉවහල් වන බව පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

6. (i) ධර්මය සන්නිවේදනයෙහිලා බුදුරජාණන් වහන්සේ භාවිත කළ සන්නිවේදන ක්‍රම ශිල්ප උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10යි.)

(ii) තෙවන ධර්ම සංගායනාවට තුඩුදුන් හේතු සැකෙවින් දක්වා බුදුසමයේ චිරස්ථිතිය විෂයයෙහි එහි ප්‍රතිඵල හේතු වූ අයුරු විමසන්න. (ලකුණු 10යි.)

7. (i) ප්‍රාග් බෞද්ධ යුගයේ ශ්‍රී ලාංකේය ජනතාව අතර ප්‍රචලිතව පැවති ඇදහිලි හා විශ්වාස නිදසුන් මගින් ප්‍රකට කරන්න. (ලකුණු 10යි.)

(ii) ශ්‍රී ලාංකික ජන සමාජයේ ගුණ ධර්ම පෝෂණයට මහින්දාගමනයෙන් සිදු වූ බලපෑම ප්‍රමාණ කරන්න. (ලකුණු 10යි.)

8. (i) ගන්ධාර හා මථුරා බුද්ධ ප්‍රතිමා සම්ප්‍රදායයන්හි ලක්ෂණ කෙටියෙන් හඳුන්වා ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමාවේ සුවිශේෂතා පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

(ii) පහත සඳහන් මාතෘකා අතරින් **දෙකකට** ප්‍රමාණවත් සටහන් ලියන්න.

(1) චේතියඝර

(2) පටිමාඝර

(3) පුරගල

(4) කොරවක්ගල

(ලකුණු 05 × 2 = 10යි.)

* * *

SHOT ON OPPO

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* I **කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, II **කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

1. (i) ක්ෂත්‍රිය වර්ණයට අයත් ස්වධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල එන යාග තුම **තුනක්** කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03යි.)
   (iii) බ්‍රාහ්මණ සම්ප්‍රදාය තුළ භාරතීය කාන්තාවගේ නිදහස සීමා කර තිබූ බවට සාධක **හතරක්** සැකෙවින් දක්වන්න. (ලකුණු 04යි.)
   (iv) මක්ඛලී ගෝසාලගේ ආගමික ඉගැන්වීම විධිමත්ව පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)
   (v) මක්ඛලී ගෝසාලගේ ඉගැන්වීම බෞද්ධ ඉගැන්වීම අනුසාරයෙන් විචාරයට ලක් කරන්න. (ලකුණු 06යි.)

2. (i) 'විජ්ජාචරණ සම්පන්නෝ' බුදු ගුණයට අයත් චරණ ධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03යි.)
   (iii) බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව සාධක **හතරක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 04යි.)
   (iv) ආදර්ශවත් බෞද්ධ උපාසකයකු වූ චිත්ත ගෘහපතිතුමාගේ චරිතය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 05යි.)
   (v) යහපත් පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීමෙහිලා සප්ත අපරිහානීය ධර්මවලින් ලැබිය හැකි පිටිවහල කොතෙක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

3. (i) "තණ්හාය ජායතී සෝකෝ" යන ධම්ම පද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)
   (ii) ඉහත 3 (i) හි සඳහන් ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) සිඟාලෝවාද සූත්‍රයේ එන ස්වාමි-භාර්යා යුතුකම් හා වගකීම් **දහය** නම් කරන්න. (ලකුණු 04යි.)
   (iv) ගිහි ජීවිතය සාර්ථක කර ගැනීමට අදාළ මංගල කරුණු **පහක්** විස්තර කරන්න. (ලකුණු 05යි.)
   (v) අසීමිත ආශාව වෙනුවට අල්පේච්ඡ ජීවිතයක කාලීන වැදගත්කම බෞද්ධ ඉගැන්වීම අනුසාරයෙන් විවරණය කරන්න. (ලකුණු 06යි.)



nload all Past Papers> https://bookbeekid.com/resource/past-pa

## II කොටස

4. (i) ඥානගරුක සමාජයක් ගොඩනැගීමෙහිලා දස පින්කිරියවත් අදාළ කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) මුදිතාවේ ප්‍රභේද පැහැදිලි කොට බෞද්ධ ප්‍රතිපදාව පිරීමට මුදිතාව පදනම් වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 10යි.)

5. (i) ලෞකික ජීවිතයේ පරමාර්ථය ආර්ථික සමෘද්ධිය පමණක් නොවන බව චතුර්විධ සැපය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පහදා දෙන්න. (ලකුණු 10යි.)

(ii) ස්වච්ඡන්දතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගලයා තුළ ආත්ම විශ්වාසය ගොඩනැංවීම පිණිස ඉවහල් වන බව පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

6. (i) ධර්මය සන්නිවේදනයෙහිලා බුදුරජාණන් වහන්සේ භාවිත කළ සන්නිවේදන ක්‍රම ශිල්ප උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10යි.)

(ii) තෙවන ධර්ම සංගායනාවට තුඩුදුන් හේතු සැකෙවින් දක්වා බුදුසමයේ චිරස්ථිතිය විෂයෙහි එහි ප්‍රතිඵල හේතු වූ අයුරු විමසන්න. (ලකුණු 10යි.)

7. (i) ප්‍රාග් බෞද්ධ යුගයේ ශ්‍රී ලාංකේය ජනතාව අතර ප්‍රචලිතව පැවති ඇදහිලි හා විශ්වාස නිදසුන් මගින් ප්‍රකට කරන්න. (ලකුණු 10යි.)

(ii) ශ්‍රී ලාංකික ජන සමාජයේ ගුණ ධර්ම පෝෂණයට මිහින්දාගමනයෙන් සිදු වූ බලපෑම ප්‍රමාණ කරන්න. (ලකුණු 10යි.)

8. (i) ගන්ධාර හා මථුරා බුද්ධ ප්‍රතිමා සම්ප්‍රදායයන්හි ලක්ෂණ කෙටියෙන් හඳුන්වා ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමාවේ සුවිශේෂතා පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

(ii) පහත සඳහන් මාතෘකා අතරින් **දෙකකට** ප්‍රමාණවත් සටහන් ලියන්න.

(1) චේතියඝර

(2) පටිමාඝර

(3) මුරගල

(4) කොරවක්ගල

(ලකුණු 05 × 2 =10 ...

* * *

ownload all Past Papers> https://bookbeekid.com/resource/past-paper